විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 01/2009 (සංශෝධන II)

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2023
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2023.12.01

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම**

ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව සිදුකිරීම හා මියගිය විශ්‍රාමිකයන්ගේ ආබාධිත අනත්දරුවන්ට ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිකර දීම සඳහා මවිසින් නිකුත් කරන ලද 2009.01.07 දිනැති අංක 01/2009 හා 2020.12.02 දිනැති අංක 01/2009 (සංශෝධන I) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛවල සඳහන් උපදෙස්වලට අමතර වශයෙන් මෙම උපදෙස් නිකුත් කෙරේ.

02. ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේ දී ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ලබා දිය යුතු දරුවන් පිළිබඳ වෛද්‍ය මණ්ඩල නිර්දේශයන් ලබා ගැනීමෙන් අනතුරුව එම වෛද්‍ය මණ්ඩල වාර්තාව අදාළ ලේඛන සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය.

03. ආබාධිත දරුවන් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය වෙත යොමු කිරීමේ අයදුම්පත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාව සහිතව මේ වන විට සංශෝධනය කර ඇත. වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමේ දී ඇමුණුම 01 හි ඇතුළත් එම නව ආකෘතිය අනුව අයදුම්පත යොමු කරන මෙන් දන්වා සිටිමි.

04. අයදුම්පත් යොමු කිරීමේ දී ඇමුණුම 02 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කළ යුතු ය.

ජී. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | කාරුණික දැනගැනීම සඳහා |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - | කාරුණික දැනගැනීම සඳහා |
| 3. | ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - | කාරුණික දැනගැනීම සඳහා |
| 4. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - | කාරුණික දැනගැනීම සඳහා |
| 5. | විගණකාධිපති | - | අවශ්‍ය කටයුතු සඳහා |

ඇමුණුම 01

යොමු අංකය ………….. දිනය……………

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,
සුවසිරිපාය,
කොළඹ 10.

**<u>සදාකාලික වශයෙන් දුබලතාවයකට පත්වූ අනත්දරුවෙකුට යාවජීව විශ්‍රාම වැටුපක් ගෙවීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීම</u>**

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයෙකුව සිටි......................................................... මහතා/මහත්මියගේ දරුවෙකු වන...................................................මහතා/මෙනවිය/මහත්මිය ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුපක් ඉල්ලා සිටී. ඔහු/ඇය වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පරීක්ෂා කර <u>නිත්‍ය ආබාධිත තැනැත්තෙක්ද</u> යන්න වාර්තා කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1. ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ඉල්ලුම්කරු පිළිබඳ තොරතුරු : -
   - I. අයදුම්කරුගේ නම : - ...........................................................
   - II. ජාතික හැඳුනුම්පත් අංකය: - .................................................................
     (ජාතික හැඳුනුම්පත් අංකයක් නොමැති නම්, ප්‍රාදේශීය ලේකම් හෝ මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කරන ලද ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතු ය.)
   - III. වයස : - ................................................................
   - IV ස්ත්‍රී/පුරුෂ භාවය : - ................................................................
   - V. ලිපිනය : - ................................................................
   - VI. දුරකථන අංකය : - ................................................................
   - VII. සෞඛ්‍ය 307 වෛද්‍ය සහතිකය අනුව ආබාධිත තත්ත්වයේ ස්වභාවය:-
     ...........................................................................................................
2. ආබාධිත ස්වභාවය පිළිබඳ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී සහතිකය මේ සමඟ යොමු කරමි.
3. මෙම වෛද්‍ය පරීක්ෂණ පැවැත්වෙන දිනය ආබාධිත අයට සෘජුවම දැනුම් දෙන්න. එහි පිටපතක් මා වෙත එවීමට කටයුතු කරන්න.
4. නිත්‍ය ආබාධිත තත්වයට පත් වූ දිනය හෝ කාලය දක්වන්න.
5. වෛද්‍ය වාර්තාවේ අත්සන් කිරීමේ දී රෝහල් අධ්‍යක්ෂකගේ නම සහිත නිලමුද්‍රාව සහ දිනය සමඟ අත්සන් කර එවීමට කාරුණික වන්න.

..............................................................
ප්‍රාදේශීය ලේකම්/මාණ්ඩලික නිලධාරී අත්සන සහ නිල මුද්‍රාව.

පිටපත :- ………………………………….
(ආබාධිත අය හෝ භාරකරු )

වෛද්‍ය අධිකාරී විසින් දැනුම් දෙනු ලබන දිනයේ දී පරීක්ෂණයට ඉදිරිපත් වන්න. වෛද්‍ය මණ්ඩල තීරණය ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව කාරුණිකව සලකන්න.

පරීක්ෂණය ප්‍රමාද වන්නේ නම් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

<u>රජයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ / සේවකයින්ගේ ආබාධිත අනත්දරුවන්</u>
<u>වෛද්‍ය පරීක්ෂණයට භාජනය කිරීම.</u>

1. ස්ථිර, විශ්‍රාම වැටුපක් හිමි දැනට රජයේ සේවයේ නියුතු රාජ්‍ය සේවකයෙකුගේ ආබාධිත දරුවන් සඳහා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුපක් ලබාදීම වෙනුවෙන් බලපවත්නා වූ නීතිමය තත්ත්වය පහත පරිදි වේ.

   1.1. 1981 අංක 44 දරණ වැන්දඹු හා අනත්දරු පනතේ 29 වන වගන්තිය.
   1.2. 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතේ 13 වන වගන්තිය.
   1.3. 2011 අගෝස්තු 15 දිනැති අංක 1719/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රය.

2. <u>පනතේ උධෘතය</u>

<u>29 සහ 13 වන වගන්ති - සදාකාලික (නිත්‍ය) වශයෙන් අබලතාවයට පත් වූ අනත්දරුවන්ට</u>
<u>යාවජීව විශ්‍රාම වැටුපක් ගෙවීම.</u>

"සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිලධාරීන් තුන් දෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත්දරුවකු ඔහුගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ ශාරීරික හෝ මානසික (තීව්‍ර හෝ නිධන්ගත රෝගී තත්වයන් ඉක්මවා ගිය) අශක්නුතාවයකින් පෙළෙන බවට තීරණය කළ විට ඒ අනත්දරුවාට වයස ගැන නොතකා මේ පනත යටතේ යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම තිබිය යුතු ය."

3. <u>වෛද්‍ය මණ්ඩල වාර්තාව ලබා දීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :-</u>

රාජ්‍ය නිලධාරියාගේ හා කලත්‍රයාගේ ඇවෑමෙන් පසු වයස අවුරුදු 26 දක්වා අනත්දරුවන්ට ද (රැකියා විරහිත) අනත්දරු විශ්‍රාම වැටුපක් ලබා ගැනීමේ නීත්‍යානුකූල හිමිකම පවතින අතර සදාකාලික දුබලතාවකින් පෙළෙන අනත්දරුවන්ට ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුපකට හිමිකම පවතී. එසේ හෙයින් වයස අවුරුදු 26 ඉක්මවන ලද දරුවන් විවිධ රෝගී තත්ත්ව හා ආබාධිත තත්ත්ව නිරූපණය කරමින් ආබාධිත විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ උත්සාහයන්ගේ වැඩිවීමක් මෑත කාලයේ වර්ධනය වී ඇත. එබැවින් ඇතැම් කල්පවතින රෝගී තත්වයන් හා සදාකාලික දුබලතාව අතර වෙනස හොඳින් හඳුනාගෙන පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

3.1. අදාළ පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම.
3.2. සියලුම සායනික වාර්තා මඟින් ස්ථිර ආබාධිත තත්ත්වයෙන් හුදු නිදන්ගත රෝග තත්වය හඳුනාගැනීම.
3.3. ඔබගේ නිර්දේශ ලබා දීමේ දී,
   3.3.1. රෝගියා හා ආබාධිතයා යන්න, වෙන්කොට හඳුනා ගැනීමෙන් පසුව **නිත්‍ය ආබාධිත අයට පමණක්** නිර්දේශ ලබා දීම.
   3.3.2. ශාරීරික හෝ මානසික අශක්නුතාව **උපතේ දී හෝ අනත්දරු වයස ඉක්මවීමට පෙර** සිට ඇති වී තිබුනේ නම් පමණක් නිර්දේශ ලබා දීම.
3.4. එම ආබාධය කිසියම් කාලයකට පමණක් පවතින්නක් නම් වෛද්‍ය මණ්ඩල නිර්දේශයේ එය පැහැදිලිව දැක්වීම.
3.5. දෙමාපියන් මිය යාමෙන් පසුව ආබාධිත විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අරමුණින් ව්‍යාජ ආබාධිත තත්ත්වයක් ඉදිරිපත් කිරීමක් ද යන්න පිළිබඳ සැලකිලිමත් වීම. එබැවින් ස්ථිර ආබාධිත තත්ත්වයෙන් හුදු නිදන්ගත රෝග හඳුනාගැනීම සඳහා සායනික ඉතිහාසය සම්බන්ධ සියලුම දත්ත සැලකිල්ලට ගත යුතු ය.
3.6. වෛද්‍ය ප්‍රතිකාර මඟින් සුව කළ හැකි ආබාධයක් නම් එම කාලය වාර්තාවට ඇතුළත් කිරීම හා රෝගියා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම.
3.7. වියපත් වීම හේතු කොටගෙන ඇතිවන සාමාන්‍ය ආබාධිත තත්ත්වයන් ද ඉහත 3.6 වර්ගයට ඇතුළත් කළ යුතු ය.
3.8. ඔහු/ඇය විවාහ වී සිටීම, දරුවන් ලබා සිටීම වැනි හේතු මත තවදුරටත් පූර්ණ ආබාධිත තත්ත්වයක් පැවතිය හැකි ද යන්න ගැන සැලකිලිමත් වීම.

ආබාධිත විශ්‍රාම වැටුප් ඉල්ලුම්කරුවන් පිළිබඳව තොරතුරු

I. අයදුම්කරුගේ නම : - ........................................................................................
II. ජාතික හැඳුනුම්පත් අංකය: - ..................................................
III. වයස : - ..................................................
IV. ස්ත්‍රී/පුරුෂ භාවය : - ..................................................
V. ලිපිනය : - .........................................................................................
VI. සෞඛ්‍ය 307 වෛද්‍ය සහතිකය අනුව ආබාධිත තත්ත්වයේ ස්වභාවය:-

...............................................................................................................................................

---

වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය පත් කිරීම

මගේ අංකය:…..........................................................

………..............................................................................................................වෙතටයි.

20......................................................මස..................වැනි දින
…............................................................................................ දී ය.

ඉහත නම සඳහන් අයගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර ඔහු / ඇය සිය ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ ශාරීරික හෝ මානසික අශක්නුතාවකින් පෙළෙන්නේ ද යන්න පිළිබඳ වාර්තා කිරීම පිණිස පත් කරන වෛද්‍ය පරීක්ෂණ මණඩලයේ සභාපති / සාමාජික වශයෙන් ඔබ පත් කරමි.

පහත සඳහන් සාමාජිකයන් සමඟ රැස් වී පරීක්ෂණයට භාජනය වන අය සිය ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවකින් පෙළෙන්නේ ද යන්න පරීක්ෂා කර බලා වාර්තා කළ යුතු ය.

**සැ.යු :- මෙම අයිතිය හිමිවන්නේ දීර්ඝකාලීන රෝග තත්ත්වයන්ට [Chronic Diseases] නොව නැවත කිසි දිනක යථා තත්ත්වයට පත් නොවන නිත්‍ය ආබාධිතයනට [Permanent Disability] පමණක් හෙයින් වාර්තා කිරීමේ දී ඒ පිළිබඳව පරීක්ෂාකාරීව අවධාරණයෙන් සලකා බැලිය යුතු ය.**

මෙම මණ්ඩලයේ සාමාජිකයන්

| මුලකුරු සමඟ නම | තනතුර |
|---|---|
| 1. …………………………………………………….. | …………………… |
| 2. …………………………………………………….. | …………………… |
| 3. …………………………………………………….. | …………………… |

………………………………….
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

# වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල වාර්තාව

## I. කොටස

01. රෝගියාගේ නම:.......................................................................................................................................

02. වයස:- ..........................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය:- ස්ත්‍රී ☐ පුරුෂ ☐

04. ජාතික හැඳුනුම්පත් අංකය:- ........................................................

05. වැ.අ.වි.වැටුප් (ක්‍රමය) යටතේ ලියාපදිංචි සාමාජිකයාගේ නම:- ........................................................

06. වැ.අ.වි.වැටුප් අංකය:- ......................................................

## II. කොටස

01. රෝග(disease)/ආබාධ(deformity) විනිශ්චය: ........................................................................
........................................................................................................................................

02. රෝග/ආබාධය පිළිබඳව සංක්ෂිප්ත ඉතිහාසය:- ........................................................................

03. රෝගයට හේතුව:- ........................................................................................................................

04. රෝගයේ බරපතල බව/සංකූලතා(විස්තර කරන්න):- ......................................................................

........................................................................................................................................

05. මෙය සංජානනීය හෝ පාරම්පරික රෝගයක් හෝ ආබාධයක් ද? ඔව් ☐ නැත ☐

ඔව් නම් ප්‍රශ්න අංක 6 සම්පූර්ණ කරන්න.

නැත නම් ප්‍රශ්න අංක 7 වෙත යන්න.

06. සංජානනීය හෝ පාරම්පරික රෝගයක් නම්, මේ වන විට රෝග ලක්ෂණ සායනික වශයෙන් නිරීක්ෂණය කළ හැකි ද යන වග

ඔව් ☐ නැත ☐

6.1මේ වන විට රෝග ලක්ෂණ නිරීක්ෂණය කළ නොහැකි නම් රෝගියා නැවත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියට පැමිණවිය යුත්තේ වසර කීයකින් පසුව ද?

වසර..................................

07. සංජානනීය/පාරම්පරික රෝගයක් නොවන්නේ නම්, රෝගය හටගත් වයස?

වයස අවු:-............................

08. රෝගය හටගත් වයස නිවැරදිව නිශ්චය කළ නොහැකි නම්, පහත පරිදි සඳහන් කරන්න.

වයස අවුරුදු 26 දී හෝ ඊට පෙර ☐ වයස අවුරුදු 26 ට පසුව ☐

09. මෙය සුව කළ හැකි තත්ත්වයක් ද?........................................................................................

☐ සුව කළ නොහැකියි.

☐ වෛද්‍ය ප්‍රතිකාර මගින් සුව කළ හැකියි.

සුව කළ නොහැකි නම්, ප්‍රශ්න 10 ට පිළිතුරු සපයන්න.

ප්‍රතිකාර මඟින් සුව කළ හැකි නම්, ප්‍රශ්න අංක 11 ට පිළිතුරු සපයන්න.

10. සුව කළ නොහැකි රෝගයක්/ආබාධයක් නම්, ඒ මඟින් රෝගියාගේ කුමන ක්‍රියාකාරීත්වයන් දුබල වී තිබේ ද ?

10.1 කායික දුබලතාවය : දළ චාලක ක්‍රියාකාරීත්වය ☐ සියුම් චාලක ක්‍රියාකාරීත්වය ☐

10.2 පෙනීම ☐

10.3 ඇසීම ☐

10.4 කථනය ☐

10.5 බුද්ධිමය ක්‍රියාකාරීත්වය (Cognitive function) ☐

11.රෝගය/ආබාධය ප්‍රතිකාර මඟින් සුව කළ හැකි නම්,

11.1 රෝගියා මේ වන විට ප්‍රතිකාර ලබමින් සිටී ද ? ඔව් ☐ නැත ☐

(එසේ නොමැති නම්, රෝගියා අවශ්‍ය ප්‍රතිකාර සඳහා අදාළ සායනයට යොමු කරන්න.)

11.2 රෝගියා ප්‍රතිකාර ලබමින් සිටින නමුත්, මේ වන විටත් ඔහු/ඇය ජීවනෝපාය සලසා ගැනීමට අපොහොසත් වන්න වූ නොහැකියාවකින් (Disability) පෙළෙන්නේ ද?

ඔව් ☐ නැත ☐

11.3 ඔව් නම් එම නොහැකියාව(Disability) මඟින් කුමන ක්‍රියාකාරීත්වයක් දුර්වල වී තිබේ ද?

11.3.1 කායික දුබලතාවය: දළ චාලක ක්‍රියාකාරීත්වය ☐ සියුම් චාලක ක්‍රියාකාරීත්වය ☐

11.3.2 පෙනීම ☐

11.3.3 ඇසීම ☐

11.3.4 කථනය ☐

11.3.5 බුද්ධිමය ක්‍රියාකාරීත්වය (Cognitive function) ☐

11.4 මෙම නොහැකියාව(Disability) කොපමණ කලක් පවතිනු ඇති ද ? වසර......................................

(මෙහි දී මෙම රෝගියාට විශ්‍රාම වැටුප පිරිනැමීම වෛද්‍යවරයා විසින් නිර්දේශ කරන්නේ නම් රෝගයේ ක්‍රමික වෙනස්වීම සහ රෝගියාගේ විශ්‍රාම වැටුප සඳහා වන යෝග්‍යතාවය සලකා බැලීම සඳහා ඔහු/ඇය නිශ්චිත කාල පරාසයකින් පසුව නැවත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කළ යුතු ය.)

## III. කොටස

**වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ අවසාන තීරණය**

ඉහත සියලු කරුණු සැලකිල්ලට ගනිමින් මෙම රෝගියා ජීවනෝපාය සලසා ගැනීමට අපොහොසත් වන්නා වූ ශාරීරික/මානසික/දෙඅංශයෙන්ම නොහැකියාවකින් පෙළෙන බව තීරණය කරමු/නොකරමු. ඒ අනුව ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුපක් ජීවිත කාලය පුරා/වසර ............. ක් දක්වා ගෙවීමට නිර්දේශ කරමු/නොකරමු.

රෝගියා වසර ………… න් වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීමට/නොකිරීමට නියමිතය.

........................................................................................................................ මයා/මිය/මෙනවිය ……………………….. දින ………………………………………………………………… රෝහලේ දී වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද බව සහතික කරමි. වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය පහත සඳහන් විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත විය.

| විශේෂඥ වෛද්‍ය නිලධාරියාගේ නම | අත්සන |
|---|---|
| 01. .............................................................................. | ............................................ |
| 02. .............................................................................. | ............................................ |
| 03. .............................................................................. | ............................................ |

## IV. කොටස

වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුමත කරමු/නොකරමු.

| | |
|---|---|
| ............................................ | ................................................ |
| දිනය | අධ්‍යක්ෂ/වෛද්‍ය අධිකාරි |
| ........................................... | ................................................ |
| දිනය | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2009 (සංශෝධන II) අනුව ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ඉල්ලුම්කරුවන් වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමේ දී සහ ලිපිගොනු එවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පිළිබඳ උපදෙස් මාලාව.**

(අ)

i. මේ වන විට රජයේ සේවයේ නිරතව සිටින නිලධාරීන් හට ආබාධිත තත්ත්වයේ පසුවන දරුවන් සිටී නම් ඔවුන් අදාළ නිලධාරියා සේවය කරන ආයතනය මගින් වෛද්‍ය මණ්ඩලයට යොමු කළ යුතු ය. දරුවාගේ මව සහ පියා යන දෙදෙනාම රජයේ සේවයේ නිරතව සිටින අවස්ථාවල දී එක් ආයතනයක් මගින් එක් අයදුම්පතක් පමණක් වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම ප්‍රමාණවත් වන අතර එම වෛද්‍ය මණ්ඩල වාර්තාව ලද පසු එය නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය. එසේම වෛද්‍ය මණ්ඩල වාර්තාවේ සහතික කළ පිටපතක් කලත්‍රයාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා අදාළ සේවා ආයතනය වෙත යොමු කළ යුතු ය.

ii. අනත්දරුවාගේ මව සහ පියා යන දෙදෙනාම රජයේ විශ්‍රාම වැටුප්ලාභීන් සහ වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය ලබා ඇති විටෙක, එම දෙදෙනාගෙන් එක් අයෙකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුව මගින් වෛද්‍ය මණ්ඩලය වෙත අයදුම්පත් යොමු කිරීම ප්‍රමාණවත් වන අතර අදාළ අයදුම්පතෙ හි සහ එම වෛද්‍ය මණ්ඩල වාර්තාවෙ හි ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද පිටපතක් කලත්‍රයාගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ද ඇතුළත් කළ යුතු ය.

iii. මව සහ පියා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකින් හෝ එක් අයෙකු විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් විශ්‍රාම වැටුප් ලබන අවස්ථාවක දී ඉල්ලීම ඉදිරිපත් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් අනත්දරුවා වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතු අතර ඒ සම්බන්ධව කලත්‍රයා විශ්‍රාම වැටුප් ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ විදේශ විශ්‍රාම වැටුප් අංශය දැනුවත් කළ යුතු ය. වෛද්‍ය මණ්ඩල වාර්තාව ලද පසු කලත්‍රයාගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා එහි සහතික කළ පිටපතක් කලත්‍රයා විශ්‍රාම වැටුප් ලබන ආයතනය වෙත යොමු කළ යුතු ය. ගෙවීම් සඳහා ලිපිගොනු දෙකම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

iv. විදේශ විශ්‍රාම වැටුප්ලාභියෙකු හට ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ලැබිය යුතු දරුවන් සිටී නම් එම දරුවන් වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් සිදු කළ යුතු අතර එසේ වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කිරීම සම්බන්ධව සලකා බලනුයේ දරුවා ශ්‍රී ලංකාවේ ජීවත් වන්නේ නම් පමණි. (අංක 1719/3 සහ 2011.08.15 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව ආබාධිත විශ්‍රාම වැටුප්ලාභියා විදේශගතව සිටී නම් විශ්‍රාම වැටුප ගෙවීමේ හැකියාවක් නොමැත.)

(ආ) ඉහත (අ) අනුව ආබාධිත අනත්දරුවෙකු වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කර නොමැති නම් ආබාධිත අනත්දරු ඉල්ලීමක දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල / විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් ම වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කළ යුතු අතර, එම වෛද්‍ය මණ්ඩල වාර්තාව ලද පසු විශ්‍රාම වැටුප ගෙවීම සලකා බැලීම සඳහා ලිපිගොනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු ය.

(ඇ) වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමේ දී පහත පරිදි ක්‍රියා කළ යුතු ය.

i. වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා චක්‍රලේඛයෙ හි ඇමුණුම් 01 යටතේ දක්වා ඇති වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමේ නව අයදුම්පත් ආකෘතිය පමණක් යොදා ගත යුතු ය. අයදුම්පත්‍රය පිටු හයකින් (06) යුක්ත වන අතර එම පිටු සියල්ලම සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

ii. අයදුම්පත්‍රයේ 03 වන පිටුවෙහි ද ඉල්ලුම්කරුගේ මූලික තොරතුරු ඇතුළත් කළ යුතු ය.

iii. අයදුම්පත සමඟ මෑතක දී (උපරිම වසරක් ඇතුළත) ලබාගත් සෞඛ්‍ය 307 වෛද්‍ය සහතිකයක් (වර්තමාන ආබාධිත තත්ත්වය පිළිබඳව වෛද්‍ය නිලධාරී නිර්දේශය) ඉදිරිපත් කළ යුතු ය.

iv. අනන්‍යතාව තහවුරු කරගැනීම සඳහා ආබාධිත දරුවාගේ ජාතික හැඳුනුම්පත් අංකය අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර, වයස අවුරුදු 16 සම්පූර්ණව ඇති නමුත් ජාතික හැඳුනුම්පතක් ලබාගෙන නොමැති නම් ජාතික හැඳුනුම්පතක් ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

v. වෛද්‍ය මණ්ඩලයට යොමු කිරීමට පෙර ඉල්ලුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායකයාගේ සුජාත දරුවෙකු ද යන්න තහවුරු කර ගත යුතු ය.

vi. එක් දායකයෙකුහට ආබාධිත තත්ත්වයක් සහිත දරුවන් කිහිප දෙනෙකු සිටින අවස්ථාවක ඔවුන් සියලු දෙනාම වෛද්‍ය මණ්ඩලයට යොමු කළ යුතු ය.

(ඈ) ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම සලකා බැලීම සඳහා ලිපිගොනුව දෙපාර්තමේන්තුවට එවීමේ දී සැලකිය යුතු කරුණු.

i. අඩුපාඩු සහිත / ආබාධිත තත්ත්වය පැහැදිලිව සඳහන් නොවන / ආබාධිත තත්ත්වය ඇති වූ කාලය නිශ්චිතව සඳහන් නොවන / ආබාධිත තත්ත්වය නිත්‍ය ආබාධිත තත්ත්වයක් ද නැද්ද යන්න පිළිබඳව පරස්පර තොරතුරු ඉදිරිපත් කර ඇති විට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත නොකරන ලද වෛද්‍ය මණ්ඩල වාර්තා නැවත සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට යොමු කර සම්පූර්ණ කර ගැනීමෙන් හෝ පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව එම වාර්තාව අදාළ ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය.

ii. වෛද්‍ය මණ්ඩල පරීක්ෂණය සිදුකර වසරකට වැඩි කාලයක් ගත වී ඇති ඉල්ලුම්කරුවන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සලකා බැලීමට ලිපිගොනුව එවීමේ දී වෛද්‍ය මණ්ඩල වාර්තාවේ සඳහන් ආබාධිත තත්ත්වය තවදුරටත් පවතින බවට ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගෙන් තහවුරුවක් ලබාගත යුතු ය.

iii. ආබාධිත විශ්‍රාම වැටුප් අයදුම්කරුවන් වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමකින් තොරව ඉදිරිපත් කරනු ලබන ලිපිගොනු නැවත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත හරවා යවනු ඇත.

iv. ඊට අමතරව ආබාධිත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අඩුපාඩු සහිතව ලිපිගොනු යොමු කිරීම මඟින් සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පහත තොරතුරු නිවැරදිව ලිපිගොනුව සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

1. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිත මූලික පරීක්ෂණ වාර්තාව සමඟ PD 4 අයදුම්පත්‍රය.
2. දායකයාගේ විවාහ සහතිකයේ, ආබාධිත අයගේ උප්පැන්න සහතිකයේ සහ දායකයාගේ සහ වැන්දඹුවගේ මරණ සහතිකයන් හි ඇති නම්වල වෙනස්කම් ඇති විට ඊට අදාළව දිවුරුම් ප්‍රකාශයක් සහ සැලකිය යුතු වෙනස්කම් පවතී නම් ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිත වාර්තාවක්.
3. ආබාධිත දරුවන් වෙනුවෙන් භාරකරුවෙකු පත් කළ යුතු වන්නේ නම් සුදුසු භාරකරුවෙකු පිළිබඳව ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 07/2020 අනුව ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිත ආබාධිත විශ්‍රාම වැටුප් භාරකාර ගිවිසුම.
4. ආබාධිත තැනැත්තා සහ භාරකරු එකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පදිංචිව සිටිය යුතු ය. නමුත් ආබාධිත තැනැත්තා පදිංචි කොට්ඨාසය තුළ සුදුසු භාරකරුවෙකු නොමැති අවස්ථාවක දී වෙනත් කොට්ඨාසයක සිටින භාරකරුවෙකු නිර්දේශ කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හැකියාව ඇත. එවැනි අවස්ථාවල දී භාරකරු පදිංචිව සිටින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප ගෙවීමට කටයුතු කරන අතර භාරකරු විසින් ආබාධිත පුද්ගලයාගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් විශ්‍රාම වැටුප යොදවන බවට මාස 03කට වරක් වාර්තාවක් කැඳවා විශ්‍රාම වැටුප් ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය.
5. වැඩිපුර ගෙවීම් සිදුව තිබේ නම් එම මුදල් අධිභාර වී තිබේ ද යන්න පිළිබඳව තහවුරුවක් ලබා ගත යුතු ය.
6. ඉහත තොරතුරුවලට අමතරව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2009 අනුව ඉදිරිපත් කළ යුතු අයදුම්පත සහ අනෙකුත් ලේඛන සියල්ල ද ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) ආබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සම්බන්ධව නිකුත් කර ඇති අංක 1719/3 සහ 2011.08.15 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ 9 වන වගන්තිය අනුව උපතින් ආබාධිත නොවන තැනැත්තන් වසර 05කට වරක් වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කළ යුතු ය. ඒ අනුව ආබාධිත විශ්‍රාම වැටුප්ලාභීන්ගේ වෛද්‍ය මණ්ඩල වාර්තා පරීක්ෂා කර උපතින් ආබාධිත නොවන තැනත්තන් වසර 05කට වරක් වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කටයුතු කළ යුතු අතර ඒ සඳහා චක්‍රලේඛයෙ හි ඇමුණුම් යටතේ ඇති නව අයදුම්පත්‍රය යොදා ගත යුතු ය. (නැවත වෛද්‍ය මණ්ඩලයක් වෙත යොමු කිරීමේ දී විශ්‍රාම වැටුප ගෙවීම නතර කිරීමකින් තොරව කළ යුතු අතර වෛද්‍ය මණ්ඩලය විසින් කැඳවන දිනට අනිවාර්යයෙන්ම ඊට සහභාගී විය යුතු බවට ආබාධිත විශ්‍රාම වැටුප්ලාභියා දැනුවත් කළ යුතු ය.) එම වෛද්‍ය මණ්ඩල වාර්තාව ලද පසු ආබාධිත තත්ත්වය තවදුරටත් පවතින බවට තහවුරු කර ඇති ආබාධිත තැනැත්තන් වෙත අඛණ්ඩව විශ්‍රාම වැටුප ගෙවීම් කිරීම සහ වෛද්‍ය මණ්ඩල වාර්තාව අනුව තවදුරටත් ආබාධිත තත්ත්වයක් නොමැති බවට සඳහන් කර ඇති විට ඔවුන් වෙත ගෙවන විශ්‍රාම වැටුප නතර කිරීමට කටයුතු කළ යුතු ය.

(ඊ) එසේම, විශ්‍රාමිකයා හෝ කලත්‍රයා ජීවත්ව සිටිය දී දරුවා වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කර එම වාර්තාව අනුමත කර ඇති ආබාධිත අනත්දරුවන් සඳහා ආබාධිත විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කරනුයේ අවසන් වරට විශ්‍රාම වැටුප් ලබාගත් තැනැත්තා එනම් විශ්‍රාමිකයා, වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා මියගිය දිනට පසු දින සිට ය. තවද විශ්‍රාමිකයා සහ වැන්දඹුව මියගිය පසු වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇති ආබාධිත අනත්දරුවන් වෙත විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කරනුයේ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල අනුමැතිය ලද දින සිට ය.